**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය - 2020**

---

**1 මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, යෝජනා ක්‍රමයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

යෝජනා ක්‍රමයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල යෝජනා ක්‍රමයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ යෝජනා ක්‍රමයේ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රමිති අංක 37 හි 59 වන ඡේදය ප්‍රකාරව, සක්‍රීය දායකයන් හා ධීවර විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් වගකීම සඳහා ආයු ගණක තක්සේරුව කාලානුරූපීව සිදු කළ යුතු වුවද 2007 වර්ෂයෙන් පසුව ආයු ගණක තක්සේරුවක් සිදු කිරීමකින් තොරව විශ්‍රාම වැටුප් වගකීම මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට එම ශේෂය රු. 4,261,454,710 ක් විය. | 2007 වර්ෂයේදී සිදු කරන ලද ආයුගණක තක්සේරුව පදනම් කරගෙන විශ්‍රාම වැටුප් වගකීම ගිණුම්ගත කර ඇත. මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ස්වයං මූල්‍ය පදනමකින් යුක්ත නොවන බැවින් ඉදිරියේදී යෝජනා ක්‍රමය ප්‍රතිව්‍යුහගත කර නිසි පරිදි වගකීම තක්සේරු කිරීමට කටයුතු කරනු ලබයි. මේ වන විට විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය පුළුල් කිරීමෙන් සාධාරණ දායකත්වයක් විශ්‍රාම වැටුප් දායකයාගෙන් ලබා ගැනීමට අදාළ සාකච්ඡා ධීවර අමාත්‍යාංශය හා මණ්ඩලය අතර පැවැත්වෙමින් ඇත. ඒ අනුව ඉදිරියේදී මේ පිළිබඳව විධිමත් ආකාරයකින් නව ධීවර විශ්‍රාම වැටුප් ක්‍රමයක් සැකසීමට හැකි වේ යැයි අදහස් කෙරේ. මේ අනුව කැබිනට් පත්‍රිකාවක් දැනටමත් ධීවර අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර ඇත. | විශ්‍රාම වැටුප් වගකීම ආයුගණක තක්සේරුව අනුව කාලානුරූපීව ගණනය කළ යුතු වීම. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2009 ජනවාරි සිට 2016 දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදයට අදාළ ධීවරයන් 121 දෙනෙකුට ගෙවිය යුතු හිඟ විශ්‍රාම වැටුප රු.3,685,792 ක් ඉකුත් වර්ෂයට ගැලපීම් නොකර සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | විශ්‍රාම වැටුප් හිමි ධීවරයින් 121 කට අදාළ හිඟ විශ්‍රාම වැටුප් වෙන් කිරීම 2020 වර්ෂයේ ගිණුම් තුළින් ගලපා නිවැරදි කර ඇත. | පෙර වර්ෂවලට අදාළ විශ්‍රාම වැටුප් එකී වර්ෂවලට ගැලපිය යුතු වීම. |
| (ආ) ගෙවිය යුතු මරණ පාරිතෝෂික අරමුදලේ රු.98,000 ක ආරම්භක ශේෂය සමාලෝචිත වර්ෂයේදී ගිණුම්ගත කිරීමේදී ශුද්ධ වාරික වියදම් ගිණුමේ ආරම්භක ශේෂය ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය හා මරණ පාරිතෝෂික අරමුදල එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම තත්ත්වය 2021 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු යොදා ඇත. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වීම. |

### 1.5.3 අරමුදලේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට යෝජනා ක්‍රමයේ විශ්‍රාම වැටුප් වගකීම රු.4,261,454,710 ක් වූ අතර එය ඉකුත් වර්ෂයට වඩා සියයට 8.83 ක වැඩි වීමකි. එසේම සමුච්චිත අරමුදලෙහි ශුද්ධ වත්කම් තත්ත්වය ඍණ රු.3,675,902,450 ක් දක්වා එනම් ඉකුත් වර්ෂයට වඩා සියයට 11.76 ක වැඩි වී තිබීමෙන් එයද යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි. තවද ඉදිරි වර්ෂයන් තුළදී මෙම තත්ත්වය තව දුරටත් වර්ධනය විය හැකි බැවින් ඒ පිළිබඳ සලකා යෝජනා ක්‍රමය ප්‍රතිව්‍යුහගත කොට මූල්‍ය ශක්‍යතාවයකින් යුතුව ක්‍රියාත්මක කිරීමට යෝජනා ක්‍රමය මෙතෙක් කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය ප්‍රතිපත්ති මත මෙම ක්‍රමයේ ප්‍රතිලාභය වාරික වැඩි කිරීමකින් තොරව සිදු කිරීම නිසා දායකයාට හිමිවන රාජ්‍ය සහනාධාර ප්‍රමාණය වැඩි වී ඇත. එබැවින් අරමුදලේ ඍණාත්මක බලපෑම ඉහළ යමින් පවතින අතර, මෙය පියවා ගැනීම සඳහා රාජ්‍ය සහනාධාර ලබා ගැනීමට සිදුවන අතර වාර්ෂික අයවැය ප්‍රතිපාදන මත අවශ්‍ය අරමුදල් ඉදිරියේදී ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි. | යෝජනා ක්‍රමය සක්‍රීය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2010 වර්ෂයේ සිට ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයෙන් ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට අවස්ථා කිහිපයකදී රු.518,000,000 ක් වූ ණය මුදල් ලබාදී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතු ණය හා පොලී මුදල් එකතුව රු.338,949,572 ක් විය. | මේ වන විට රු.මිලියන 338.9 ක මුදලක් ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය වෙතින් අයවීමට ඇති අතර, ණය මුදල හා ඒ මත පොලිය ඉහත ශේෂය තුළ ඇතුළත්ව ඇත. අයවීමට ඇති ඉතිරි ණය මුදල ක්‍රමිකව අයකර ගැනීමට අපේක්ෂිතය. | ණය සහ පොලිය අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත | | | |
| (i) 5 සහ 6 වගන්ති | නියමිත සුදුසුකම් දරන්නාවූ ද වයස අවු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 59 ට නොවැඩි ධීවරයන්හට තම වෘත්තීය කටයුතු කරගෙන යාමට නොහැකි ස්ථිර අර්ධ දුබලතාවයක් හෝ පූර්ණ දුබලතාවයක් වූ විට ආර්ථික වශයෙන් යම් පිටුවහලක් වීමට දීමනාවක් ගෙවීම, මරණයකදී මරණ පාරිතෝෂිකයක් ගෙවීම හා වයස අවුරුදු 60 සම්පූර්ණ වූ විට කාලපරිච්ඡේද අනුව විශ්‍රාම වැටුපක් ගෙවීම අරමුණු කරගෙන මෙම යෝජනා ක්‍රමය ආරම්භ කර තිබූ නමුත් 2018 වර්ෂයෙන් පසු යෝජනා ක්‍රමයට කිසිදු සාමාජිකයෙකු බඳවාගෙන නොතිබුණි. | නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් ආරම්භ කිරීමට ඉදිරිපත් කර ඇති කැබිනට් මණ්ඩල පත්‍රිකාව සඳහා අනුමැතිය ලද පසු නව බඳවා ගැනීම් ප්‍රවර්ධනයට අවශ්‍ය කටයුතු සිදු කිරීමට අපේක්ෂිතය. | යෝජනා ක්‍රමය සක්‍රීය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ii) 7 වන වගන්තිය | දායකයෙකුට වයස අවුරුදු 60 සම්පූර්ණ වූ දින සිට විශ්‍රාම වැටුප් සඳහා හිමිකම් ලබන නමුත් යෝජනා ක්‍රමය විසින් විශ්‍රාම වැටුප් සකස් කළ දින සිට ගෙවීම් කර තිබූ අතර හිඟ විශ්‍රාම වැටුප් මුදල් | පැරණි හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම තාවකාලිකව අත්හිටුවීම නිසා මෙම තත්ත්වය උදාවී ඇති අතර තහවුරු ලබාගැනීමෙන් පසු | විශ්‍රාම වැටුප් සඳහා හිමිකම් ලබන දින සිට ගෙවීම් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | ගෙවා නොතිබුණි. එම නිසා 2009 ජනවාරි සිට 2016 දෙසැම්බර් දක්වා කාලයට අදාළව විශ්‍රාම වැටුප් ඉල්ලුම් කළ ධීවරයන් 176 ක් සඳහා ප්‍රතිපාදිත හිඟ විශ්‍රාම වැටුප් රු. 4,828,177 ක් ගෙවීමට කටයුතු කර නොතිබුණි. | අදාළ මුදල් ගෙවීමට කටයුතු කරනු ලබයි. | |
| (iii) 16 වන වගන්තිය | දායකයෙකු දායක මුදල් ගෙවීමේදී අනුගාමී වාරික දහයක් සඳහා වාරික මුදල් නිසිපරිදි නොගෙවීම මත ප්‍රතිලාභ අහිමි වී ඇති අවස්ථාවක ඒ බව දායකයා වෙත දැනුවත් කිරීම් කළ යුතුයි. එසේ වුවද එම දැන්වීම නොකිරීම හේතුවෙන් වයස අවුරුදු 60 සම්පූර්ණ වූ විශ්‍රාම වැටුප් ලැබීමේ හිමිකම ඇති බව අදහස් කරමින් පුද්ගලයින් 58 දෙනෙකු විසින් අයදුම්පත් ඉදිරිපත් කර තිබුණි. | දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති නිළධාරීන් වාරික අයකරීම සිදු කරනු ලබන අතර දායකත්වය අහෝසි වූ දායකයින්ගේ දායක මුදල් වයස අවුරුදු 60 සම්පූර්ණ වූ පසු පොලිය ද සමඟ ආපසු ගෙවනු ලබයි. විගණනය විසින් පෙන්වා දී ඇති කරුණු නැවත සිදුනොවීමට අදාළ දැනුවත් කිරීම් කරනු ලබයි. | අනුගාමී වාරික දහයක් සඳහා වාරික මුදල් නිසිපරිදි නොගෙවීම මත ප්‍රතිලාභ අහිමි වී ඇති අවස්ථාවක ඒ බව දායකයා වෙත දැනුවත් කිරීම් කළ යුතු වීම. |
| (iv) 20 වන වගන්තිය | පිහිටුවා ඇති උපදේශක කාරක සභාව විසින් පනතේ 22 වන වගන්තියෙන් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා පැවරී ඇති බලතල ක්‍රියාත්මක කළ යුතු අතර ඒ සඳහා උපදේශක කාරක සභාව රැස්විය යුතු වුවත්, 2016 නොවැම්බර් මාසයෙන් පසුව මේ දක්වාම කාරක සභාව රැස්වී නොතිබුණි. | ඉදිරියේදී නව බඳවාගැනීම් ආරම්භ කිරීමට සැලසුම් කර ඇති බැවින් කඩිනමින් උපදේශක කාරක සභාව කැඳවීමට අවශ්‍ය පියවර ගනු ලබයි. | පනත ප්‍රකාරව උපදේශක කාරක සභාව රැස්විය යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 40,281,891 ක පාඩුවක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ පාඩුව රු.16,207,069 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.24,074,822 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂයේ පොලී ආදායම් හා ධීවරයන්ගේ දායක මුදල් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2020 වර්ෂයට අදාළ ක්‍රියාත්මක සැලැස්ම ප්‍රකාරව ධීවර | ලේඛන සුරක්ෂිත කිරීම සඳහා ලේඛනාගාරයක් | සැලසුම් ප්‍රකාරව |

| | | |
|---|---|---|
| විශ්‍රාම වැටුප් කාඩ්පත් සුරක්ෂිත කිරීම සඳහා දිස්ත්‍රික් අනුව කාඩ්පත් වර්ග කිරීම, කාඩ්පත් පරිලෝකනය(scan) කිරීම සහ ගබඩා කිරීමට මෙන්ම ධීවර විශ්‍රාම වැටුප් ලාභීන්ගේ දත්ත "ලේඛන කළමනාකරණ ක්‍රමවේදයක්" (Document Management System) තුළින් සුරක්ෂිත කිරීමට සැලසුම් කර තිබුණ ද එම සැලැස්ම ක්‍රියාත්මක කර නොතිබුණි. | සැකසීමට හා නව පරිගණක පද්ධතියක් සැකසීමට අවශ්‍ය කටයුතු මේ වනවිට සිදුකරමින් පවතී. | කටයුතු කළ යුතු වීම. |
| (ආ) 2016 – 2020 සංයුක්ත සැලැස්මෙහි, දේශීය කෘෂිකාර්මිකයාට ස්ථාවරත්වයක් ලබාදීම සඳහා පවතින සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම යාවත්කාලීන කිරීම සහ නව ආරක්ෂණ යෝජනා ක්‍රම හඳුන්වාදීමට සැලසුම් කර තිබුණි. එසේ වුවද පවතින ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය කාලීන අවශ්‍යතාවයන් අනුව සංශෝධනය කර නව ධීවර විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දීමක් හෝ පවත්නා ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායකයින් බඳවා ගැනීමක් පසුගිය වසර කිහිපය තුළ දක්නට නොලැබුණි. | නව රජයේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් පිළිබඳ සඳහන් කර ඇති බැවින් එම රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව අවශ්‍ය කටයුතු මේ වන විට සිදුකර ඇත. | සැලසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |